බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2022
------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යනය හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පෙර තෝරාගත් ජාතික මාර්ගවල කිලෝමීටර් 27 ක් වැඩිදියුණු කිරීම, සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,232.5කට සමාන එ.ජ.ඩො. මිලියන 24.87ක් වන අතර එයින් රු.මිලියන 2,209.84කට සමාන එ.ජ.ඩො. මිලියන 17ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 28 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කටයුතු 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 5 හි 43 (අ) වගන්තියට අනුව, එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා වත්කම් සහ බැරකම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේ දිනයේ විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය අනුපාත ගැලපීම් රුපියල් මිලියන 2,268 සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි. | 2,268 | ව්‍යාපෘතියේ විදේශ ණය වාර්තා කිරීම සිදු කරනු ලබන්නේ රුපියල් වලින් වන අතර විනිමය අනුපාතිකය සලකා බලනු නොලබයි. එබැවින් රුපියල් මිලියන 2,576.53ක් මූල්‍ය ප්‍රකාශනවල ණය උපයෝජනය වශයෙන් පෙන්වා ඇති අතර විදේශ ණය ශේෂය ලෙස රුපියල් මිලියන 4,844.95 ක ශේෂයක් විසර්ජන සවිස්තර වාර්තාවේ හඳුනාගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පැකේජ අංක එකට අදාළ අංක 47 දරන අතුරු ගෙවීම් සහතිකය ප්‍රකාරව, සිවිල් වැඩවලට අදාළ රුපියල් මිලියන 170ක ප්‍රතිපාදන ගිණුම්ගත කර නොතිබූ අතර,සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ එම මුදලින් අඩුවෙන් සඳහන් කර තිබුණි. | 170 | එකඟ වේ. කඩුවෙල - අතුරුගිරිය මාර්ගය සඳහා 2022 දෙසැම්බර් සඳහා යොමු කරන ලද අතුරු ගෙවීම් සහතිකය මූල්‍ය ප්‍රකාශන සැකසීමෙන් පසු PMU වෙත ලැබී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය - 04 හි 18 වැනි වගන්තියට අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන විට NSB ණයට අදාළ ණය ගැනීමේ පිරිවැය ව්‍යාපෘතිය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 119.38 | ව්‍යාපෘතිය ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණයක් ලබාගෙන නොතිබූ නමුත් හදිසි ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් රුපියල් මිලියන 119.38 ක තාවකාලික මූල්‍ය ආධාර ලැබී ඇති අතර එම මුදල ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ඈ) | ඔපෙක් වාර්තාවල තොරතුරුවලට අනුව, 2022 වසර සඳහා ණය මුදලින් ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 508.21 ක මුදලක් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වූ නමුත්, ගිණුම්ගත කර තිබුණේ රුපියල් මිලියන 474.43 ක් පමණක් වන අතර ඉතිරි මුදල රුපියල් මිලියන 33.78ක් මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු විදේශ ආධාර ලෙස පෙන්වා තිබුණි. ඒ අනුව, ණය මුදලින් ලබා ගත් මුදල ව්‍යාපෘතිය විසින් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වැරදි ලෙස ඉදිරිපත් කර තිබුණි. | 508.21 | එකඟ වේ. 2022 වර්ෂය සඳහා ලබා දුන් මුළු මුදල් ප්‍රමාණය රු. මිලියන 508.21 කි. ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ සිටම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාව මත පදනම්ව ණය ලබා දීම ගිණුම්ගත කර ඇත. එබැවින් ව්‍යාපෘතිය රුපියල් මිලියන 474.43 මූල්‍ය ප්‍රකාශන වල දක්වන ලද අතර ඉතිරි මුදල රුපියල් මිලියන 33.78 ක් ලැබිය යුතු විදේශ ආධාර ලෙස අප පෙන්වා දී ඇත. | ERD වාර්තා සහ රාජ්‍ය ගිණුම් සැසඳීමට ක්‍රියා කළ යුතුය. |

**2.2 නොපියවූ ශේෂයන්**

| අංකය | විස්තරය | මුදල රු. මිලියන | නොපියවූ කාලසීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට වසර පහකට වැඩි කාලයක් තුළ වෙළඳ දැන්වීම්, මැනුම් කටයුතු, නායයෑම් අධ්‍යයනය, පදික වේදිකාව සැලසුම් කිරීම සහ පාරිසරික උපදේශන වියදම් සඳහා වෙනත් ව්‍යාපෘතිවලින් ලැබිය යුතු එකතුව රුපියල් මිලියන 17.62ක ශේෂ 03 ක් | 17.62 | වසර 5ට වැඩි | ප්‍රමාණවත් අග්‍රිම ලැබුණු පසු, අදාළ ව්‍යාපෘතිවලින් ලැබිය යුතු ශේෂ අය කර ගනු ඇත. | ප්‍රමාදයකින් තොරව ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අයකර ගැනීමට ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | | |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රුපියල් මිලියන 119ක දිගුකාලීන ණය ගැනීම් ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වල ස්කන්ධය යටතේ දක්වා තිබුණද, ණය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එම ණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිසි අනුමැතිය ලබාගෙන නොමැති බවද නිරීක්ෂණය විය. | 119 | වසර 5ට වැඩි | මෙය මාර්ග සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘතියට ලබා ගත් ණයක් නොවන අතර හදිසි ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම් පියවීමට ලබාගත් මුල්‍ය ආධාරයක් පමණි. | මූල්‍ය ආධාර සම්බන්ධ අනුමත ලියකියවිලි විගණනයට සැපයිය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක් සඳහා වූ ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2015 ජූනි 26 වැනි දින අත්සන් කරන ලද අතර 2019 ජූනි 30 වැනි දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන්, අරමුදල් නියෝජිතායතනය විසින් ණය අවසන් දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. ණය ආපසු ගෙවීම 2020 දී ආරම්භ කර තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විට මුළු ණය පහසුකම්වලින් සියයට 21 ක් නියෝජනය කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 3.66 ක් ව්‍යාපෘතියට භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | එකඟ වේ. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. 2023 ජූනි 30 වන විට මුළු ණය පහසුකම්වලින් සියයට 84.7 ක් නියෝජනය කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 14.4ක් ව්‍යාපෘතියට භාවිතා කිරීමට හැකි විය. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | කඩුවෙල සිට අතුරුගිරිය මාර්ගයේ පැකේජ-1 පුනරුත්ථාපන කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු 2018 ජනවාරි 29 වන දින රුපියල් මිලියන 1,065 ක පිරිවැයකට ආරම්භ කර 2019 ජූලි 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් දින 1,315ක කාලය දීර්ඝ කිරීම මගින් 2023 මාර්තු 04 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල වුවද, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව ප්‍රමාද හානි කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීමේ පිරිවැයට අදාළව රුපියල් මිලියන 65ක් ඉල්ලා ඇති බවත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය සැලකිල්ලට නොගෙන | ව්‍යාපෘතිය ප්‍රමාද වූයේ කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය නිසා නොවේ. මූලික අදියරේදී වන්දි නොගෙවීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වූ අතර අවසාන භාගයේදී ද්‍රව්‍යමය වශයෙන් විශේෂයෙන් ඉන්ධන හිඟයට තුඩු දෙන රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. එබැවින්, EOT සහ අදාළ හිමිකම් සඳහා කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත. | අමතර වියදම් දැරීමෙන් තොරව නියමිත වේලාවට වැඩ නිම කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය එම හිමිකම් පෑම අනුමත කර ඇති බවත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | කඩුවෙල - අතුරුගිරිය මාර්ගයේ රුපියල් මිලියන 1,065ක් වන මුල් කොන්ත්‍රාත් වටිනාකම දීර්ඝ ව්‍යාපෘති කාලසීමාව සහ ප්‍රමාණ වෙනස්කම් හේතුවෙන් රුපියල් මිලියන 1,518 ක් දක්වා රුපියල් මිලියන 453 කින් වැඩි වී තිබූ අතර එය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 42 ක් නියෝජනය කරයි. කෙසේ වෙතත්, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අවශ්‍ය අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | B.O.Q. වටිනාකම පහත සඳහන් හේතු නිසා වැඩි විය<br><br>1. ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම.<br><br>2. දැනට පවතින B.O.Q සකස් කිරීමේදී බෝක්කු පුළුල් කිරීමට යෝජනා කර ඇත. නමුත් ඉන්ජිනේරුවරයා විසින් එම බෝක්කු වල ඇති තත්ත්වය හේතුවෙන් බොහෝ බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමට නිර්දේශ කර ඇත.<br><br>3. මහජන ඉල්ලීම මත මුලින් හඳුනාගත් ඉදිකරන ලද කාණු දිග විශාල ලෙස වැඩි කරන ලද අතර බොහෝ ව්‍යාපාරික ස්ථාන සඳහා ආවරණ ස්ලැබ් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය |
| (ඈ) | ව්‍යාපෘතියේ උපදේශන ගිවිසුම 2018 මාර්තු 08 දින රුපියල් මිලියන 148 කට ආරම්භ කරන ලද අතර අවසන් දිනය 2019 ජූලි 28 විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් උපදේශන ගාස්තුව රුපියල් මිලියන 291 දක්වා සංශෝධනය කර තිබූ අතර අවසන් කිරීමේ දිනය 2023 ජනවාරි 31 දක්වා කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි. නමුත් නිසි අනුමැතියකින් තොරව රුපියල් මිලියන 144ක මුදලක් ගෙවා තිබුණි. | සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් උපදේශන ගිවිසුම වරින් වර සංශෝධනය විය. උපදේශන කාලය දීර්ඝ කිරීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගන්නා ලදී. | අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය |
| (ඉ) | කොන්ත්‍රාත් පැකේජය සඳහා ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තු නිවැරදිව සකස් කර නොතිබීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 3,233 පසුව රුපියල් මිලියන 4,590 ක් දක්වා සියයට 42 ක් නියෝජනය වන පරිදි රුපියල් මිලියන 1358 කින් වැඩි කර තිබුණි. තවද එය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය | ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව විදේශීය හා දේශීය ප්‍රතිපාදන වැනි කොටස් දෙකකින් සමන්විත වේ. රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් විදේශ ප්‍රතිපාදන වැඩි වූ අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පොලී ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් දේශීය ප්‍රතිපාදන වැඩි විය. | පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කොන්ත්‍රාත්තුවේ පිරිවිතරවල 122 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉංජිනේරු කාර්යාලය සඳහා අවශ්‍ය සියලුම උපකරණ ඔහුගේ වියදමින් සැපයිය යුතු අතර ව්‍යාපෘතිය අවසන් වූ පසු ඉංජිනේරු | තරඟකාරී පදනමින් ලංසු කැඳවනු ලබන අතර ඒ අනුව ලංසුකරුවන් තම ලංසු ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු | කොන්ත්‍රාත්කරුවන්ට ලැබෙන අනිසි ප්‍රතිලාභ අවම කිරීම සඳහා හොඳ ගිවිසුම් |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය සඳහා උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට කාර්යාල උපකරණ සඳහා එක්වර ගෙවීම් වශයෙන් රුපියල් මිලියන 10.35 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ පිරිවිතරවල 126 උප වගන්තියට අනුව කොන්ත්‍රාත්තුව අවසානයේ ඉංජිනේරුවරයා වෙත ලබා දී ඇති වාහන කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතු අතර, වාහන සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 26.11 ක මුදලක් ව්‍යාපෘතිය විසින් එකවර ගෙවා ඇත. .ඒ අනුව, අසාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි මගින් කොන්ත්‍රාත්කරුට අනිසි ප්‍රතිලාභ අත්කර දීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය. | භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙන බැවින් අයිතමවල ක්ෂයවීම් අගය ඔවුන්ගේ ලංසුවල සලකා බලනු ඇතැයි උපකල්පනය කළ හැකිය. | කොන්දේසි හඳුන්වා දිය යුතුය. |
| (උ) | **OFID-3/1** පැකේජයට අදාළ රුපියල් මිලියන 408 ක අතුරු ගෙවීම් සහතික අංක 34 සිට 40 දක්වා ගෙවීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් නියමිත වේලාවට ඉදිරිපත් කර තිබුණද, ව්‍යාපෘතිය ප්‍රමාදයන් සහිතව ගෙවීම් පියවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට රුපියල් මිලියන 12ක අතිරේක වැට් බද්දක් ගෙවීමට සිදු වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් පියවීමේ ප්‍රමාදය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. | වැට් බදු ගෙවීම පියවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුනු අතර අදාළ වැට් බදු ගෙවීම මෙම වසර (2023) තුළ සිදු කරණු ඇත, ගෙවන දිනය සඳහා වත්මන් අනුපාතය අදාළ වේ. | කොන්ත්‍රාත් කොන්දේසි අනුව කොන්ත්‍රාත්කරුගේ වගකීම ප්‍රමාදයකින් තොරව පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 3.2 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කටයුතු සඳහා රජයේ ඉඩම් කට්ටි 548ක් ඇතුළුව ඉඩම් කට්ටි 2,747 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ රුපියල් මිලියන 1,470 ක වන්දි මුදල් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. ඊට අමතරව 2022 දෙසැම්බර් 31 දින දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොලී වශයෙන් රුපියල් මිලියන 420 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කට්ටි 337 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, එය ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑ හැකිය. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ අත්පත් කරගත් ඉඩම් ලියාපදිංචි කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DSS) විසින් සිදු කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ ප්‍රමාදයක් ඇති අතර එය සම්පූර්ණ කිරීම සඳහා සිහි කැඳවීම් කිහිපයක් යවා ඇත.අත්පත් කර ගත යුතු ඉඩම් ප්‍රමාණය හැර සපයන ලද විස්තර නිවැරදි වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු හා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 නිෂ්ක්‍රිය/ අක්‍රිය/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|

**2022** වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් පිළිවෙළින් විදේශ ණය සහ රජයේ වියදම් සඳහා රුපියල් මිලියන **550**ක් සහ රුපියල් මිලියන **250**ක් ලෙස ප්‍රතිපාදන ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ප්‍රගතිය මන්දගාමී වීම හේතුවෙන් සියයට **14** ක් නියෝජනය වන පරිදි රුපියල් මිලියන **75.3** ක විදේශ ණය ප්‍රතිපාදන සහ සියයට **72** ක් නියෝජනය වන පරිදි රුපියල් මිලියන **180** ක ශ්‍රී ලංකා රජය වෙන් කළ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි

රුපියල් මිලියන **75.56**ක් විදේශ ආධාර ලැබිය යුතු ලෙස පෙන්වා ඇත.

**GOSL** සංරචකය යටතේ ප්‍රමාණවත් අග්‍රිම ප්‍රමාණයක් ලැබී නොමැත. ඒ නිසා, ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනවලින් සියයට **28**ක් පමණක් භාවිතා කිරීමට සිදුවිණි

ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.